# සුරක්ෂා අරමුදල
# SURAKSHA FUND



බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.
Prison Head Quarters, Colombo 09.
දුරකථන අංකය *(Tel.)* - 01146 77177 ෆැක්ස් *(Fax)* - 01146 77180

<u>සුරක්ෂා අරමුදලේ සංශෝධිත ව්‍යවස්ථාව.</u>

01. නම : සුරක්ෂා අරමුදල

02. ලිපිනය : බන්ධනාගාර මූලස්ථානය,බේස්ලයින් පාර ,කොළඹ 09.

03. ක්‍රියාත්මක දිනය : 2015.02.01 වෙනි දින ( සංශෝධන ඉදිරිපත් කිරීමට පෙර )

04. අරමුණ : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන්,කලත්‍රයා හා දරුවන් සෞඛ්‍ය සම්බන්නව තබා ගැනීම.

05. කවුරුන් සඳහාද : මෙම අරමුදලට සාමාජික වූ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවයේ තනතුරුවල සේවය කරන නිළධාරීන්,ඔහුන්ගේ කලත්‍රයා හා අවිවාහක යැපෙන දරුවන් වෙනුවෙන් ( පිරිමි දරුවෙකු නම් වයස අවුරුදු 24 දක්වාද,ගැහැණු දරුවෙකු නම් වයස අවුරුදු 28 දක්වා ද විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වයස් සීමාවකින් තොරවද ) හා සාමාජිකයා අවිවාහක නම් තමන්ගෙන් යැපෙන දෙමාපියන් සඳහා.

06. ගෙවන ආකාරය : පිළිගත් වෛද්‍යවරයෙකුගේ /වෛද්‍යවරුන්ගේ නිර්දේශය මත ඉහත අංක 05 හි සඳහන් අයට ,පහත සටහන 01 හි සඳහන් බෝනොවන රෝග සඳහා වූ සැත්කම් සඳහා ගෙවීමටත් ( රෝග විනිශ්චය ( Diagnosis) කළ දිනය සාමාජිකත්වය ලබා ගත් දිනට පසු දිනයක් විය යුතුය.)සාමාජිකයාගේ මරණය වෙනුවෙන් හා වෛද්‍ය නිර්දේශය මත විශ්‍රාම ගන්වනු ලබන සාමාජිකයන් සඳහා සටහන 02 අනුව ගෙවීමටත්,ස්වායත්තව සිදුවන ශාරීරික තුවාල හෝ අර්ධ දුබලතාවලින් කුමව හෝ එක් දුබලතාවයක් සඳහා (වෛද්‍ය නිර්දේශය මත ) සටහන 03 අනුව සාමාජිකයාට ගෙවීමටත් , ඉහත ගෙවීම් ( සටහන 01 අනුව ) ලබා ගත් දින සිට වසරකට එක් වරක් පමණක් අංක 01 සටහන අනුව ගෙවීමටත්,අංක 01 සටහනේ උපරිමයට යටත්ව බිල්පතේ සටහන් මුදල ගෙවනු ලැබේ. ගෙවීමේදී අරමුදලේ කාරක සභාව මගින් පත් කරනු ලබන මණ්ඩලයක පරීක්ෂාවකින් පසුව ගෙවනු ලැබේ.විශ්‍රාම යාමේදී ගෙවනු ලබන 2/3 ක මුදල ගෙවීම සඳහා ගරු සභාපති තුමාගේ හා ගරු භාණ්ඩාගාරික තුමාගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම.ප්‍රතිලාභ ලබාගත් යම් සාමාජිකයකු සාමාජිකත්වයෙන් ඉවත් වන්නේ නම් ඔහු හෝ ඇය සඳහා ගෙවනු ලැබූ ප්‍රතිලාභ මුදල සාමාජිකත්වය ඉවත් වන බව දැණුම්දුන් මාසයේ සිට විශ්‍රාම ගන්නා දිනය දක්වා කාල සීමාව තුලදි උපරිම වාරික 60 කින් හා රුපියල් 5000/= ක මාසික වාරික මුදලකට යටත්ව නැවත අයකර ගත යුතුය. එමෙන්ම විශ්‍රාම ගැනීමට නියමිත කාල සීමාව අනුව මෙම වාරික ගණන හා මුදල වෙනස් විය හැක.

රජයේ රෝහලක බෝ නොවන රෝග සැත්කම් සඳහා ප්‍රතිකාර ලබා ගැනිමේදී පහත අංක 01 හි සඳහන් රෝග ලැයිස්තුවේ 01,02 හා 03 හි සඳහන් සැත්කම් සඳහා දිනකට රුපියල් 1000.00 බැගින් උපරිම දින 10කට යටත්ව ගෙවීමටත්,එමෙන්ම අංක 01 සටහනෙහි සඳහන් 04 හා 05 හි සඳහන් සැත්කම් සඳහා දිනකට රුපියල් 3000.00 බැගින් උපරිම දින 10කට යටත්ව ගෙවීම් සිදු කෙරෙන අතර මෙහිදී රෝහලට ඇතුලත් වූ දිනය හා රෝහලෙන් බැහැර වූ දිනයන් සඳහා ප්‍රතිලාභ ගෙවනු නොලැබේ.

ඉහත සඳහන් පරිදි පුද්ගලික රෝහලක සිදු කරනු ලබන, අංක 01 සටහනෙහි සඳහන් සැත්කම් සඳහා පමණක් ප්‍රතිලාභ හිමිකම් ඇති අතර ඉන් පරිබාහිර රෝගී සැත්කම් සඳහා ප්‍රතිලාභ හිමිකම් නොමැත. එමෙන්ම පුද්ගලික රෝහලක සැත්කම් සඳහා නේවාසිකව ප්‍රතිකාර ලද දිනයන් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම් සිදු නොකෙරේ.

CamScanner

07.ඇතුළත්වීම/ සාමාජික මුදල : සෑම නිළධාරියෙක්ම අරමුදලේ සාමාජිකයෙකු වීම සඳහා රුපියල් 2000/= ක ඇතුලත්වීමේ ගාස්තුවක් ගෙවිය යුතු අතර,මාසිකව රුපියල් 300/=ක මුදලක් වැටුපෙන් අයකර අරමුදලට බැරකල යුතුය.(දැනටමත් රුපියල් 2000/=ක ටිකට්පත් අලෙවිකර ඇත්නම් හෝ අලෙවිකර ඇති ටිකට්ලත් වල වටිනාකම හා රුපියල් 2000/= අතර වෙනස ගෙවිය යුතුය.)

අඛන්ඩව මාස 03 ක කාලයක් කිසියම් කරුණක් නිසා ( වැඩ තහනම් වීම ආදී ) සාමාජික මුදල ගෙවීම පැහැර හැර ඇත්නම් සාමාජිකත්වය අහිමි වන අතර , සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමට අත්පිට මුදලින් සාමාජික වාරික මුදල් ගෙවීමට අවස්ථාව ඇත. එපරිදි අඛණ්ඩව සාමාජිකත්වය පවත්වාගෙන නොයන්නේ නම්, නවක සාමාජිකයෙකු ලෙස නැවත සාමාජිකත්වය ලබා ගත හැක.සේවයට බැදී වසර 03ක් ඇතුලත සාමාජිකත්වය ලබාගත යුතුය.විශ්‍රාමයාමේදී විශ්‍රාම යන දින සිට සාමාජිකත්වය අහිමි වේ.

08. ක්‍රියාත්මකවීම : සාමාජිකත්වය ලබා මාස (03) තුනකින් පසුව ප්‍රතිලාභ ලබාදෙනු ඇත.( 2021.04.06 දින මහා සභා රැස්වීමේදී මෙය මාස 12 ලෙස සංශෝධනය කරන ලදී.)

09. අරමුදලේ නිමවුල්ල : නිල බලයෙන් සභාපති තනතුරට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් පත්වේ. ලේකම්, භාණ්ඩාගාරික,නියෝජ්‍ය ලේකම්වරුන් දෙදෙනෙකු, නියෝජ්‍ය සභාපති, විගණකවරුන් දෙදෙනෙකු,කාරක සභාවට ආයතන වලින් එක් නිලධාරියකු බැගින් ද, සහ වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් පත්කරනු ඇත.සණ පූර්ණය 15 කි.

10. බැංකු අවශ්‍යතා : සභාපති හෝ ලේකම් හා අනිවාර්යයෙන්ම භාණ්ඩාගාරික යන නිලධාරීන්ගේ අත්සනින් යුතුව බැංකු ගිණුම් ක්‍රියාත්මක වේ. බැංකුව ලංකා බැංකුව බොරැල්ල වන අතර ගිණුමේ නම සුරක්ෂා අරමුදල වේ.මාසික බැංකු විස්තරයක් භාණ්ඩාගාරික විසින් පිළියෙල කර විගණක වරුන්ගේ පරීක්ෂාවෙන් අනතුරුව කාරක සභාවට ඉදිරිපත් කරනු ඇත.

11. අයිතිවාසිකම් : විශ්‍රාම ගන්නා විටදී හෝ දෙපාර්තුමේන්තුවෙන් ඉවත්වී යන අවස්ථාවකදී සාමාජිකයා විසින් ප්‍රතිලාභයක් නොගෙන ඇත්නම්, එතෙක් සාමාජිකයා විසින් අරමුදලට ගෙවන ලද මුදලින් (රු. 2000.00ක මුදල හා මාස තුනක සාමාජික මුදල හැර ) 2/3 ක් ආපසු ගෙවනු ලැබේ. ස්වකැමැත්තෙන් ඉල්ලා අස්වන සාමාජිකයින් සදහා 2/3 ගෙවීමක් හෝ කිසිදු ගෙවීමක් සිදු නොකරන අතර(මෙම සංශෝධනය 2022.07.02 දින මහා සභා රැස්වීමේදී සිදු කරන ලදී.) _නැවත සාමාජිකත්වයටද බදවාගනු නොලැබේ. වෙනත් රක්ෂණ ක්‍රම වලින් ලබාගන්නා රක්ෂණ මුදල් මෙම අරමුදලට අදාල නොවේ. ගෙවීම් සඳහා ජායාස්ථ පිටපත් පිළිගනු ලබන්නේ මුල් පිටපත හා සැසදීමෙන් පසුව පමණි.

12. ව්‍යවස්ථා සංශෝධන: මෙහි ඇතුලත් කොන්දේසිවලට අමතරව යම් කොන්දේසියක් ඇතුලත් කිරීම හෝ සංශෝධණය කිරීම අවශ්‍යවෙ නම් එය අරමුදල විසින් පත්කළ කමිටුවක් විසින් සිදුකරනු ඇත. එය මහා සභා රැස්වීමේදී වැඩි ඡන්දයෙන් සම්මත විය යුතුය.

13. සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය : 2019.11.08 වන දින සිට නව සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක වේ.

CS CamScanner

සටහන 01(සංශෝධිත )

පහත සඳහන් සැත්කම් සඳහා ප්‍රතිලාභ හිමිකම් ලබා ගත හැක.

| CATEGORY | PAID ONLY FOR SURGERIES | IN GOVERNMENT HOSPITAL STAY MORE THAN THREE DAYS. | IN PRIVATE HOSPITAL STAY UPTO |
|---|---|---|---|
| 01 | ✓ Appendctomy<br>✓ Breast Lumpectomy<br>✓ Dilation & Curettage<br>✓ Clean & Dressing<br>✓ Incision & Drainage<br>✓ Skin Graft<br>✓ Diverticulectomy<br>✓ Airway Obstruction Surgery<br>✓ Fistulectomy<br>✓ Herniotomy & repair<br>✓ Hydrocolectomy<br>✓ Histeroscopy<br>✓ Heamarroidectomy | Rs.1000.00x10 | Rs.30000.00 |
| 02 | ✓ Laparoscopic Examination<br>✓ Bladder stone<br>✓ Prostatic Calculi<br>✓ Tonsillectomy<br>✓ Myomectomy<br>✓ Oophorectomy | Rs.1000.00x10 | Rs.30000.00 |
| 03 | ✓ Acute Abdomen related surgery<br>✓ Post Partum Hemorrhage related surgery<br>✓ Tympanoplasty<br>✓ Mastoidectomy | Rs.1000.00x10 | Rs.30000.00 |

CS CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 04 | ✓ Major Burn related surgery<br>✓ Uretertic Calculi related surgery<br>✓ Renal Calculi related surgery<br>✓ Lung Surgery<br>✓ Cholecystectomy<br>✓ Hysterectomy<br>✓ Mastectomy<br>✓ Prostatectomy<br>✓ Thyroid surgery<br>✓ Carotid End Arterectomy<br>✓ Partial Colectomy<br>✓ Small bowel Obstruction Surgery<br>✓ Brain Surgery related to Heamotaric | | Rs.3000.00x10 | Rs.300000.00 |
| 05 | ✓ Cancer related surgery<br>✓ Coronary Artery Disease related surgery<br>✓ Angioplasty<br>✓ Heart Valve Replacement<br>✓ Aortic aneurism related surgery<br>✓ Pancrectomy<br>✓ Colonel Cancer related surgery<br>✓ Rectal Cancer related surgery<br>✓ Anal Cancer related surgery<br>✓ Major Organ transplant<br>✓ Brain tumor related surgery<br>✓ Major head trauma related surgery<br>✓ Terminal illness related surgery<br>✓ Spinal cord related surgery<br>✓ Back Bone related surgery (non congenital) | | Rs.3000.00x10 | Rs.300000.00 |

CS CamScanner

සටහන 02

මීට අමතරව පහත සඳහන් විශේෂ අවස්ථා සඳහා ප්‍රතිලාභ හිමිකම් ලබා ගත හැක.

| අනු අංක | විස්තරය | ගෙවනු ලබන උපරිම මුදල |
|---|---|---|
| 01 | සාමාජිකයාගේ මරණය වෙනුවෙන් | 100,000.00 |
| 02 | වෛද්‍ය නිරදේශය මත විශ්‍රාම ගන්වනු ලබන සාමාජිකයින් සඳහා | 100,000.00 |

සටහන 03

ස්වායත්ථව සිදුවන ශාරීරික තුවාල හේතුවෙන් පහත දැක්වෙන අර්ධ දුබලතා වලින් කුමන හෝ එක් දුබලතාවයක් සඳහා ප්‍රතිලාභ හිමිකම් ලබා ගත හැක.(වෛද්‍යවරයාගේ නිර්දේශය තිබිය යුතුය.)

| සිද්ධිය | ප්‍රතිඵලය | ගෙවනු ලබන ප්‍රතිලා මුදල |
|---|---|---|
| හුදෙක් අන් කිසිම හේතුවකින් වූ ප්‍රතිඵල ඇති , සාහසික වූද බාහිරමය වූද දෘෂ්‍යමාන ආකාරයකින්,(අ),(ආ),(ඇ),(ඈ) හෝ යටතේ සිදුවන ශාරීරික තුවාල . | (අ) එක් ඇසක හෝ ඇස් දෙකේම පෙනීම සදාකාලික හා සම්පූර්ණයෙන්ම නැවතීම. | 150,000.00 |
| | (ආ) අතක් හෝ පයක් ශරීරයෙන් වෙන්වීම හෝ සම්පූර්ණයෙන්ම නැතිවීම . | 150,000.00 |
| | (ඇ) ගොළු භාවය | 100,000.00 |
| | (ඈ) පහත සඳහන් ආකාරයට ශරීර අවයවයන් වෙන්වීමෙන් වූ නැති වීම. | |
| | 01. එක් අතක හෝ අත් දෙකේම සියළු ඇඟිලි නැතිවීම . | 50,000.00 |
| | 02. එක් පයක හෝ දෙපාවල සියළු ඇඟිලි නැතිවීම. | 50,000.00 |

අංක 01 සටහනෙහි සඳහන් රෝගී සඳහා වූ සැත්කම් වෙනුවෙන් විශේෂඥ වෛද්‍යවරයාගේ නිර්දේශය සමග අදාල අයදුම් පත ඉදිරි පත් කල යුතුය.

අංක 02 සටහනෙහි සඳහන් තත්වයන් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා ගැනීමේ දී අදාල පිළිගත් ලේඛණ (මරණ සහතිකය හා වෛද්‍ය වාර්ථා) ඉදිරි පත් කල යුතු අතර සිය දිවි හානි කර ගැනීම වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම් නොකෙරේ.

ගරු ලේකම්
එච්.කේ පල්ලතැන්න
බන්ධනාගාර අධිකාරී

ගරු සභාපති
වී.එන්.උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

CamScanner